# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2014-01-30

**වේලාව** : පෙ.ව. 10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

1. ගරු සභාපති — ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
2. ගරු උප සභාපති — ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා
3. නගර සභා ගරු මන්ත්‍රී — ධර්මසේන සමරසිංහ මැතිතුමා
4. නගර සභා ගරු මන්ත්‍රී — ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
5. නගර සභා ගරු මන්ත්‍රී — එම්. ටී. එම්. රූමි මැතිතුමා
6. නගර සභා ගරු මන්ත්‍රී — එම්. නිමල් කරුණාරත්න මැතිතුමා
7. නගර සභා ගරු මන්ත්‍රී — අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා
8. නගර සභා ගරු මන්ත්‍රී — චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා
9. නගර සභා ගරු මන්ත්‍රී — එම්. ජේ. මලික්ෂා මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් — එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු උප සභාපතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කියැවූ ලෙස සලකා එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළුම දෙනා ගරු සභාපතිතුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

2014 වර්ෂය සඳහා සම්මත කරගත් අයවැය ලේඛනය අනුව වැඩකටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම අනුව ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා සමඟ කොළඹ දී හමුවකට සහභාගී වූ බවත්, ඒ අනුව රු. මිලියන 431ක් සංවර්ධනය සඳහා බලන්ගොඩ ප්‍රදේශයට ලබා දී ඇති බවත්, එම මුදල් යොදවමින් ග්‍රාමීය සංවර්ධනය ජනතාවට දැනෙන අන්දමින්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය සහිතව සිදු කිරීමට බලාපොරොත්තු වන බව එතුමන් සඳහන් කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

හිටපු ගරු අමාත්‍ය අබුසාලි මැතිතුමන් තම සීයා බව පසුගිය මහා සභා වාර්තාවේ සඳහන්ව ඇතත් එතුමා තමන්ගේ බාප්පා ලෙස නිවැරදිව සඳහන් විය යුතු බව නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ප්‍රකාශ කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 2014 වර්ෂයේ වරිපනම් බිල්පත් නිවැරදි කිරීම සඳහා - බළන්ගොඩ පොලිස් ස්ථානය

බළන්ගොඩ පොලිස් ස්ථානයට අයත්,

| | |
|---|---|
| අංක 216/4 1/1 | - ෂීට් සෙවිලි පවරාගත් උඩු මහල |
| අංක 216/4 | - උලු සෙවිලි කර තිබූ පවරා ගත් සැලූන් එක |
| අංක 216/3 | - උලු සෙවිලි කර තිබූ පවරා ගත් කිරිහල |
| අංක 216 | - උලු සෙවිලි කර තිබූ පවරාගත් ලංගම කාර්යාල ගොඩනැගිල්ල |
| අංක 209 | - ෂීට් සෙවිලිව තිබූ කඩකාමරය |

යන ගොඩනැගිලි සියල්ල 2013 වර්ෂයේ දී කඩා ඉවත් කර ඇති බැවින්, මෙම වරිපනම් බිල්පත් නිවැරදි කරන මෙන් බළන්ගොඩ පොලිස් ස්ථානාධිපතිතුමන් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, ඒවා තක්සේරු ලේඛනයෙන් සම්පූර්ණයෙන් ඉවත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:02 පදිංචි වී නොමැති ගොඩනැගිලි වෙනුවෙන් වරිපනම් අය කිරීම සම්බන්ධව - අයි. බී. අයි. පලන්සූරිය මිය

බළන්ගොඩ, කෙළින් වීදිය, අංක 15 ස්ථානයේ පිහිටි වරිපනම් අංක 10672 දරන ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය ජාතික රක්ෂණ සංස්ථා කාර්යාලය එම ස්ථානයෙන් ඉවත් කිරීමෙන් පසුව එම ගොඩනැගිල්ල පරිහරණය නොකරන බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් අයි. අයි. බී. පලන්සූරිය යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, අදාල වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:03 85/2 ස්ථානයේ වරිපනම් වෙනස් කිරීම - සී. බී. ජයතිලක මයා**

බළන්ගොඩ, පරණ පාර, අංක 85/2 දරන ස්ථානයේ ගබඩා කාමරයක් නොමැති බැවින් එය වරිපනම් ලේඛනයෙන් ඉවත් කර දෙන ලෙස සී. බී. ජයතිලක යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම දේපළ ඉඩම් කොටසක් ලෙස වාර්ෂික වටිනාකම රු. 1,000.00ක් තක්සේරු ලේඛනගතකර වරිපනම් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 වරිපනම් සහනයක් ලබා දීම - තානායම් පාර අංක 14, 14 1/1, 14 2/1, 14 3/1**

තානායම් පාර, අංක 14 දරන ස්ථානයේ හිමිකරු වන එස්. පී. දයාරත්න මහතාට අයත් ඉහත අංක දරන දේපල සඳහා වරිපනම් සහනයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලද අතර, ඉහත අංක දරන ස්ථානයන් සඳහා 2014 වර්ෂයට වරිපනම් 25%කින් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 නගර සභාව මගින් බදු මුදල් අය කිරීම සාධාරණීකරණය කිරීම - ඊ. කේ. ලීලසේන මයා**

ඇල්ලෙඅරාව, බළන්ගොඩ යන ස්ථානයේ පදිංචි තක්සේරු අංක 614 දරන දේපලට වාර්ෂික වරිපනම් මුදල වශයෙන් රු. 1,655.95ක මුදලක් ගෙවීමට සිදුව ඇති බැවින් ඒ සඳහා සහනයක් ලබා දෙන මෙන් ඊ. කේ. ලීලසේන ය නඅය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එය අවට නිවාස සමඟ සංසන්දනයේ දී සාපේක්ෂව වැඩි වාර්ෂික වටිනාකමක් බැවින්, දැනට වාර්ෂික වටිනාකම වන රු. 47,998.00ක ප්‍රමාණය 25%කින් අඩු කර රු. 35,990.00ක් සේ සලකා වරිපනම් අය කිරීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 වරිපනම් බදු ගෙවීම සම්බන්ධව - පද්මිනී ශ්‍රියාලතා විතාරණ මිය**

බළන්ගොඩ මෙගොඩ කිරිඳිගල අංක 949 ස්ථානයේ පදිංචි පද්මිණී ශ්‍රියාලතා විතාරණ යන අයගේ නිවසට තක්සේරු අංක 125 යටතේ වාරිකයකට රු. 114.28 බැගින් වසරකට රු. 568.00ක් ද, තක්සේරු අංක 127 යටතේ වාරිකයකට රු. 57.68 බැගින් වසරකට රු. 500.00ක් ද ගෙවන ලද බව ද, එම නිවසේ කොටසක පවත්වාගෙන ගිය වෙළඳසැල මේ වන විට වසා දමා ඇති බව ද, සඳහන් කර එම වෙළඳ සැල වෙත ගෙවීමට සිදුවූ වරිපනම් මුදලින් නිදහස් කර දෙන මෙන් ඉල්ලා ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට

දැනුම් දුන් අතර, අදාල නිවසට පමණක් 4%ක බැගින් වරිපනම් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 හානියට පත් නිවස ඉදිකරීම - ටී. ඩී. විජේතුංග මයා**

බලන්ගොඩ, ඕලුගංතොට, පංසල යට පාර ස්ථානයේ පදිංචි ටී. ඩී. විජේතුංග යන අයගේ නිවස 2013.11.23 වන දින පැවති අධික වර්ෂාව හේතුවෙන් හානියට පත්ව ඇති බැවින් ඒ සඳහා ආධාරයක් සිදු කරන මෙන් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, ඒ සඳහා රු. 10,000.00ක ආධාර මුදලක් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 වරිපනම් සහනයක් ලබා ගැනීම - සී. රවීන්ද්‍රකුමාර් මයා**

රාස්සගල පාර, අංක 330/4 දරන පැරණි තහඩු සෙවිළි කළ ගොඩනැගිල්ල මේ වන විට කඩා ඉවත් කර ඇති බැවින් වරිපනම් සහනයක් ලබා දෙන මෙන් සී. රවීන්ද්‍රකුමාර් යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එය ඉඩමක් ලෙස සලකා වාර්ෂික වටිනාකම රු. 1,000.00ක් ලෙස තක්සේරු කර වරිපනම් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 නිවසක් නාය යාම සම්බන්ධව - ඩබ්. එම්. සුමනවීර මයා**

බලන්ගොඩ, සඳුන්ගම, බැංකියවත්ත, අංක 196/සී/ඒ යන ස්ථානයේ පිහිටි තම නිවවස පස් කන්දක් කඩා වැටීමෙන් නිවස හානියට පත් වූ බැවින් එය ප්‍රතිසංස්කරණය සඳහා ආධාරයක් දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, ඒ සඳහා රු. 5,000.00ක මුදලක් සභා අරමුදලෙන් ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර,

වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 වරිපනම් බදු ගෙවීම සම්බන්ධව - සුනිල් රිදීවිට මයා**

බලන්ගොඩ, බාන්ස් රත්වත්ත මාවතේ අංක 1/96 දරන ස්ථානයේ පවත්වාගෙන ගිය පරණ යකඩ බඩු කඩය එම ස්ථානයෙන් ඉවත් කර ඇති බැවින්, අදාල නිවසට පමණක් වරිපනම් මුදල් අය කරන මෙන් සුනිල් රිදීවිට යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු

සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, එහි පැරණි නිවස සඳහා පමණක් වරිපනම් ගාස්තු අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 මහජන පුස්තකාල අතුරු ව්‍යවස්ථාව**

බලන්ගොඩ මහජන පුස්තකාලයීය නව අතුරු ව්‍යවස්ථා කෙටුම්පත ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. මීළඟ මහා සභා රැස්වීමේ දී ඒ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීමට තීරණය විය.

**06:12 වරිපනම් සහනයක් ලබා ගැනීම - ෆාතිමා ෆරිහානා මිය**

තමන් සතු වරිපනම් අංක 166 බී සහ 166 ඩී දරන කඩකාමර දෙක සිව් වසරක පමණ සිට වසා ඇති බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් ෆාතිමා පරිහානා යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර 2014 වර්ෂය සඳහා අයකරන වරිපනම් මුදලින් 50%ක් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:13 වරිපනම් සහනයක් ලබා ගැනීම - ලි. අබේරත්න මයා**

රාස්සගල පාර, බුලත්ගම වරිපනම් අංක 304 යටතේ පවත්වාගෙන ගිය විජේවික්‍රම වඩුමඩුව මේ වන විට වසා ඇති බැවින් වරිපනම් සහනයක් ලබා දෙන මෙන් ලි. අබේරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම ස්ථානයට 2014 වර්ෂය සඳහා අය කළ යුතු වරිපනම් මුදලින් 50%ක් අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:14 මූල්‍ය රීති 83 යටතේ මූල්‍ය පාලනය පිළිබඳ බලතල පැවරීම**

මූල්‍ය රීති 83 යටතේ මූල්‍ය පාලනය පිළිබඳ බලය පැවරීම සම්බන්ධ විස්තරය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:15 එළහරක් මස් කඩය ගිවිසුම් අත්සන් කර නොමැතිව තාවකාලික බලපත්‍ර මත පවත්වාගෙන යාම**

2014 වර්ෂය සඳහා අංක 16 දරන එළහරක් මස් කඩය සඳහා එක් මසක තැන්පත් මුදල් පමණක් ගෙවා ඇති අතර, 2014 වර්ෂය සඳහා ගිවිසුම් අත්සන් කර නොමැති අතර, දින 14කට වරක් තාවකාලික බලපත්‍ර පමණක් ලබා දී ඇති බව ද, මෙවැනි ගැටලු සහගත තත්ත්වයක් යටතේ මෙම මස් කඩය පවත්වාගෙන යාම නීත්‍යානුකූල නොවන බව විෂය භාර නිලධාරිනිය විසින් වාර්තා කර ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලදී.

පොදු වෙළඳසැල අංක 16 දරන එළ හරක් මස් කඩය සඳහා මාස තුනක කුලී මුදලට සමාන මුදලක් තැන්පත් කළ යුතු වුවත් වෙළඳාම අඩු බැවින් එසේ කිරීමට නොහැකි බව එම්. රියාස් යන අය විසින් දන්වා ඇති බව ද, මාසික කුලිය මාසිකව ගෙවීමට කටයුතු කරන බව ඔහු වැඩි දුරටත් සඳහන් කර ඇති බව ද ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, සභා ආදායම් එකතු කර ගත යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාවට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:16 වරිපනම් මුදල සංශෝධනය කර ගැනීම - බී. ඒ. එස්. ජයරත්න මයා**

අංක 16/16 දරන නිවසේ කිසිවකු පදිංචිව නොසිටින බැවින් හා අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ලබා දෙන මෙන් බී. ඒ. එස්. ජයරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, 2014 වර්ෂය සඳහා එම ස්ථානයට අදාල වරිපනම් මුදලින් 50%ක් අඩුවෙන් අය කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:17 ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම - ශෛලතලාරාම පාර, අංක 09**

රජයෙන් ලබා දී ඇති ශෛලතලාරාම පාර අංක 09 කරන දේපල එහි අයිතිකරු වන බී. කේ. ඒ. එස්. ශාන්තිලතා යන අයගේ නමින් ලේඛනගතව ඇති බවත්, භුක්තිය භාර දී ඇති බවට ප්‍රාදේශිය ලේකම් විසින් ලබා දුන් ලිපියක් ද ඉදිරිපත් කර ඇති බැවින් මෙම අයගේ නම් තක්සේරු ලේඛනවලට ඇතුළත් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:18 නගරයේ වෙළඳ ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡාවේ වාර්තාව**

සෙනසුරාදා මහජන පොල පැවැත්වීම සම්බන්ධව හා කම්කරු නිවාඩු දින පිළිබඳව දැනුවත් කිරීම සඳහා නගරයේ වෙළෙන්දන් සමඟ පැවති සාකච්ඡාවේ වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:19 6 වන 3 ආර් රැස්වීම - ආසියානු පළාත් පාලන ආයතන - ජපානය**

2014.01.19 වන දින සිට 2014.02.21 වන දින දක්වා ජපානයේ යොකොහාමා නගරයේ ජයිකා ආයතනයේ දී පැවැත්වීමට නියමිත ආසියානු පළාත් පාලන ආයතන සඳහා වන 6 වන 3 ආර් වැඩසටහන සඳහා බළන්ගොඩ නගර සභාව වෙනුවෙන් සහභාගී වීමට මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා තෝරාගෙන ඇති බවත්, එම වැඩසටහනට සහභාගී වීම වෙනුවෙන් වන සියලු වියදම් වැඩමුළුව සංවිධානය කරනු ලබන ආයතනයෙන් දරන බවත්, ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දන්වන ලද අතර, ඒ සඳහා සහභාගී වීම සඳහා 2014.02.18 වන දින සිට 2014.02.22 වන දින දක්වා විදේශ නිවාඩු ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

06:19 **2014 ඉන්ධන දීමනාව ලබා ගැනීම - ගරු උප සභාපතිතුමා, නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

පළාත් පාලන කොමසාරිස් 2012.05.29 දිනැති අංක 3/2012 දරන චක්‍රලේඛයට අනුව තමන්ට හිමි 2014 ජනවාරි මාසයට අදාල තම ඉන්ධන දීමනාව ලබා දෙන මෙන් ගරු උප සභාපතිතුමන් සහ නගර සභා ගරු මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:20 මාර්ග තලනය කුළියට ලබා දීම**

මෙම නගර සභාවේ මාර්ග තලනය කුළී පදනම මත ලබා දෙන මෙන් ලංකා බැංකුවෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලද අතර, එය කුළී පදනම මත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව මහා සභාවේ වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, එහි දී ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ බාහිර පාර්ශවයන්ට කුළී පදනම මත ලබා දීමට වඩා එය මෙම සභාව මගින් සිදු කරන සංවර්ධන කාර්යයන්ට පමණක් යොදා ගැනීම සුදුසු බවයි. එබැවින් සියලු දෙනාගේ එකඟත්වයෙන් මාර්ග තලනය බාහිර පාර්ශවයන්ට කුළී පදනම මත ලබා නොදීමට තීරණය කරන ලදී.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

සභා යෝජනා අංක **12:01** යටතේ සම්මත කරනු ලබන මුදල් කාරක සභා වාර්තාවට රු. 10,000.00ට වැඩි ගෙවීම් ඇතුළත් වේ.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 මුගුණමලේ කලුඇල්ලේ කැලේ අතුරු මාර්ගය කොටසක් කොන්ක්‍රීට් කිරීම

මුගුණමලේ කලුඇල්ලේ කලේ අතුරු මාර්ගය කොටසක් කොන්ක්‍රීට් කිරීම කර්මාන්තය සඳහා සකස් කරන ලද රු. 154,320.00ක මූල්‍ය ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:02 2014 වාර්ෂික සැලැස්ම ඉදිරිපත් කිරීම

බලන්ගොඩ නගර සභාවේ වාර්ෂිකව ක්‍රියාත්මක කිරීමට යෝජිත සැලැස්ම ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, එය ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

මෙවර මහා සභාවට ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබිණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

මෙවර මහා සභාවට යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි

## 11. යෝජනා

### 11:01 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා

11:01:01 2014 මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම

1. තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතියට එෆ්. එම්. මයික් එකක් සහ ලොකු බෆල් දෙකක් ලබා දීම - රු. 30,000.00 (දළ වශයෙන්)
2. බුලත්ගම දෙමළ විදුහල් මාවතේ කාණු පද්ධතිය සෑදීම
3. බැංකියවත්ත පියදාස මහතාගේ නිවස මාර්ගය පැතිබැම්ම දමා මාර්ගය සකස් කිරීම

ගරු උප සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 11:02 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

11:01:01 පිට්ටනිය සෑදීම සඳහා පස් ලබා ගැනීම

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාවන් ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, එහි දී, නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින්, දැනට පස් කපන ස්ථානයන්හි ඇති පිරිසිදු පස් ගෙනැවිත් ක්‍රීඩා පිටිය අසළ ගොඩකර තැබීමෙන්, ක්‍රීඩා පිටිය සකස් කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී ඒවා භාවිතයට ගැනීමට හැකි වීමෙන් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන ලදී. එම කරුණු සලකා බැලීමෙන් අනතුරුව එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 12:01 මුදල් කාරක සභා වාර්තාව

2014.01.27 වන දින පැවති මුදල් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:02 තානායම් කාරක සභා වාර්තාව

2014.01.27 වන දින පැවති තානායම් කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 12:03 කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව හා සංවර්ධන උපදේශන කාරක සභා වාර්තාව

2014.01.27 වන දින පැවති කර්මාන්ත හා සංවර්ධන කාරක සභා වාර්තාව හා සංවර්ධන උපදේශන කාරක සභා රැස්වීම් වාර්තාවන් ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව නගර සභා ගරු මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම

13:01 2013 නොවැම්බර් මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 2,523,154.90 |
| වෙනත් ලැබීම් | 1,023,922.41 |
| **මුළු ලැබීම්** | **3,547,077.31** |
| පුනරාවර්තන වියදම් | 6,956,070.87 |
| වෙනත් වියදම් | 2,270,607.94 |
| **මුළු වියදම්** | **9,226,678.81** |

- බලන්ගොඩ තානායමේ 2013.12.01 වන දින සිට 2013.12.31 වන දිනයෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**13:02 2013.12.01 සිට 2013.12.31 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව**

2013.12.01 සිට 2013.12.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාලව වාහන සඳහා මුළු ඉන්ධන වියදම රු. 769,659.15 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වැය මාරුව

මෙම සභාවේ වැය මාරු කිරීමට අදාල තොරතුරු සහිත ලේඛනය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් මේ සම්බන්ධව වෙනත් අදහස් තිබේ දැයි විමසන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒවා මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 15. වෙනත් කරුණු

**14:01 නගර සභා ගරු එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

බලන්ගොඩ ආසනයේමුස්ලිම් ජනතාව බොහෝ පිරිසක් ජීවත් වන ෆලීල් හජ්ජියාර් මාවත සහ ගොරොක්ගහමඩ මුස්ලිම් දේවස්ථානය කේන්ද්‍රකර ගනිමින් ඇති ප්‍රදේශයේ නිවසක සුපිරි හෝටලයක් ගොඩනැගීමට සූදානමක් පවතින බව නගර සභා ගරු මන්ත්‍රීතුමන් විසින්

ප්‍රකාශ කරන ලදී. මුස්ලිම් ජනතාව ජීවත්වන ගම්මානයක මෙබඳු හෝටලයක් ආරම්භ කිරීම නුසුදුසු බව ද, එය මුස්ලිම් ජනතාවගේ සංස්කෘතියට නොගැලපෙන බව ද එතුමන් විසින් සඳහන් කරන ලද අතර, ප්‍රධාන මුස්ලිම් පල්ලිය, ර/ ආනන්ද මෛත්‍රෙය ජාතික පාසැල හා මිරිස්වත්ත පිරිවෙන ද අසල පිහිටා තිබෙන බව ද වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. මෙය ආරම්භ කිරීම නතර කර දෙන ලෙස ගරු සභාපතිතුමන් වෙතින් සහ සභාවෙන් එතුමා ඉල්ලා සිටින ලදී.

*මෙයට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමන් ප්‍රකාශ කළේ, ඕනෑම තැනක ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට අවස්ථාව ඇති බවත්, හෝටල් සඳහා මත්පැන් හල් බලපත්‍ර ලබා ගැනීමට නොහැකි බවත්, මුස්ලිම් ගම්මානයන්හි නාම පුවරු ප්‍රදර්ශනය නොකර පවත්වාගෙන යන තවත් එවන් ස්ථාන ඇති බවත්, නගර සභා ගරු මන්ත්‍රීතුමන් සඳහන් කරන ස්ථානය ආරම්භ කරන ලද්දේ ඩුබායි හි ජීවත්වන ඉංජිනේරුවකු බව ද, හෝටලයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ඔහු විසින් ඉල්ලා ඇති බවත්, එසේ බලපත්‍රයක් ලබා දීමේ දී අදාල නිර්ණායක පරීක්ෂා කිරීමෙන් අනතුරුව බලපත්‍රය නිකුත් කරන බවත්ය.*

*හේතුවක් නොමැතිව එක්වර හෝටලයක් තහනම් කළ නොහැකි බව ද, නවාතැන් පොල අතුරු ව්‍යවස්ථාවේ කොන්දේසි මත එසේ බලපත්‍ර ලබා දීමට මෙම සභාව බැඳී සිටින බවත්, සභාපතිතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී. මේ සම්බන්ධව විරෝධතා ඇතොත් විෂය භාර ගරු අමාත්‍යවරයා වෙත ඇපෑලක් ඉදිරිපත් කළ හැකි බවත් එතුමා ප්‍රකාශ කරන ලදී. එම ස්ථානය පවත්වාගෙන යන ආකාරය පරීක්ෂාකර බලා පසුව තීරණයක් ගැනීම කළ හැකි බව ද ගරු සභාපතිතුමන් විසින් පැහැදිලි කරන ලදී.*

**14:02 නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

සබරගමුව පළාත් රාජ්‍ය සේවා ක්‍රීඩා තරගාවලිය රත්නපුර සහ බළන්ගොඩ නගරයන්හි දී පැවති බවත්, එහි දී ලද ජයග්‍රහණයන් හේතුවෙන් නගර සභාවේ නාමය ඉහලට ගෙන ගිය බව ද නගර සභා ගරු මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් ප්‍රකාශ කරන ලදී. ක්‍රීඩා ඇඳුම් වලට මුදල් වෙන් කිරීම සම්බන්ධව ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා විරුද්ධ වුව ද, බළන්ගොඩ නගර සභාව එකම ඇඳුමකින් ක්‍රීඩා පිටියට පිවිසෙන විට සියළු දෙනාගේ ප්‍රශංසාවට ලක් වූ බව ද, ක්‍රිකට් හා දැල් පන්දු ශූරතාවය මෙම නගර සභාවට හිමි කර ගැනීමට උපකාරී වූ සියලු දෙනාටම තම ස්තුතිය හිමි වන බව ද එතුමන් සඳහන් කරන ලදී. ගරු සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපාදන වලින් ක්‍රීඩා ඇඳුම් ලබා දීම සම්බන්ධව තමන් විරුද්ධ වන බව ද, එය සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බව ද එතුමන් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී.

බළන්ගොඩ නගරය සංවර්ධනය සඳහා රු. මිලියන 450ක මුදලක් ලබා දීම සම්බන්ධව තමන් නියෝජනය කරන වසම් සංවර්ධනය සඳහා නගර සභා ගරු මන්ත්‍රීවරුන්ට රු. ලක්ෂ දහය බැගින් ප්‍රතිපාදන ලබා දීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ට සහ ආර්ථික සංවර්ධන ගරු අමාත්‍යතුමන්ට තම ස්තුතිය පිරිනමන බව ද නගර සභා ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:03 ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

පාරිභෝගික සේවාවන් ද නොපිරිහෙලා ඉටු කරමින්, ගරු සභාපතිතුමන් ඇතුළු නගර සභාවේ සේවයේ නියුතු සියලු දෙනා එක්ව එක් හැඟීමකින් ක්‍රීඩා තරග ජයග්‍රහනය වෙනුවෙන් කැපවී ක්‍රියාකිරීම තමන් අගය කරන බව ද, එම අවස්ථාවන්ට නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා සහභාගී වූවා නම් වඩාත් වැදගත් බව ද ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

නිසි පරිදි ක්‍රීඩාංගනයක් නොමැතිව ලබා ගත් මෙම ජයග්‍රණයන් ඉතා වටිනා බව ද, ක්‍රීඩා පිටියක් තිබුණි නම් මීටත් වඩා ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වනු ඇති බව ද ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

චෙට්නෝල් පාර සහ සුදර්ශනගම පාර හැකි ඉක්මනින් සංවර්ධනය කර දෙන මෙන් ද, තමන් විසින් ඉල්ලා ඇති වීදි ලාම්පු සවි කර දෙන මෙන් ද එතුමන් ඉල්ලා සිටින ලදී.

සමාජයේ සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව එක්ව සිටිය යුතු බවත්, මහජන ගැටලු දැක්වීමේ දී මුස්ලිම් ජනතාව යනුවෙන් පමණක් වෙන් කර දැක්වීම නුසුදුසු බවත්, එවන් බෙදීමක් ඇති වීම අනාගතයේ නොයෙක් දුර්විපාකයන් ඇතිවීම පිණිස හේතු විය හැකි බවත් ගරු උප සභාපතිතුමන් ප්‍රකාශ කරන ලදී.

**14:04 නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

ගරු උප සභාපතිතුමන් ද ප්‍රකාශ කළ පරිදි ජාතීන් සියල්ල එකමුතුව සිටිය යුතු බවත්, මුස්ලිම් ගම්මාන වල මෙන්ම සිංහල ගම්මානයන්හි ද හෝටල් ඉදිවන බවත්, ජන වර්ග වශයෙන් ඒ ගැන සලකා බැලීම නුසුදුසු බවත්, එවන් ස්ථාන හේතුවෙන් යම් අපචාරයන් සිදුවේ නම් ඒවා වැළැක්වීමට කටයුතු කළ යුතු බවත් නගර සභා ගරු මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා ප්‍රකාශ කරන ලදී.

සෑම විටම කාර්යයක් සිදු කිරීමේ දී පෙර නායකයන් ගන්නා ලද තීරණයන් සලකා බැලිය යුතු බවත්, උදාහරණයක් වශයෙන් හිටපු අතිගරු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා නොයෙකුත් පර්යේෂණයන් සිදුකරමින් ජනතාවට සේවය කළ බව ද, නගර සභා ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය සඳහා පස් ගෙනැවිත් දැමීම පිළිබඳ යෝජනාව ද එසේ සලකාබලා තමන් විසින් සිදු කළ බව ද, මෙම සභාවේ ධූරකාලය නිමවීමට පෙර ක්‍රීඩා පිටිය සෑදීමට සියලු නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා එක් විය යුතු බව ද, පස් එකතු වූ පසු තම උපරිම දායකත්වයෙන් ක්‍රීඩාපිටිය ගොඩනැංවීමට කටයුතු කරන බව ද, ලෝකයේ සියලු ජයග්‍රහණයන්ට හේතු වූයේ අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම බව ද, දිවයිනේ හොඳම නගර සභාවක් වන බළන්ගොඩ නගර සභාවට කළ නොහැකි දෙයක් නොමැති බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු සභාපති එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

මෙවර සභාවාරය සඳහා පැමිණි ගරු උප සභාපතිතුමන්, නගර සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය හා ජනමාධ්‍යවේදීන් ඇතුලු දෙනාට ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමන් ප.ව. 1.30ට පමණ පමණ මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.